**බේරුවල ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 01 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 26 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අභ්‍යාසලාභී දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.183,285 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු දීමනා එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ සභාව වෙත ලැබිය යුතු රු.2,072,096 ක් වූ ප්‍රාග්ධන ආධාර මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේදී ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන වෙනුවෙන් ගෙවිය යුතු මුදල මූල්‍ය ප්‍රකාශවල රු.189,678 ක් වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 අසම්භාව්‍ය බැරකම්

ප්‍රධාන ජංගම ගිණුමෙන් ලබාගෙන තිබූ අයිරා පහසුකම වෙනුවෙන් සභාව සතු රු.575,000 ක් වටිනා ස්ථාවර තැන්පතු ඇපයට තබා තිබුණද මේ බැව් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.268,077,598 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් සමග සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් රු.182,538,560 ක්ද, අඩුවෙන් දැක්වීම් රු.18,196,728 ක්ද නිරීක්ෂණය විය.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ශේෂ සනාථ ලිපි, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 152,563,001 ක් වූ ගිණුම් විෂයයන් 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### **1.3.5** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති රු.6,320,805 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය තුළ වසර 05 ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.272,931 ක් වූ අතර මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වසර ගණනාවක සිට පැවත එන වීථි පහන් නඩත්තු වෙනුවෙන් ලැබිය යුතු රු.6,351,534 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

### 1.3.6 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්යය නිමවූ වහාම පිය විය යුතු වුවද, 2014 වර්ෂය දක්වා ලබාදී තිබුණු රු.425,880 ක් වූ අත්තිකාරම් මුදල් විගණිත දිනය වූ 2016 ජූනි 10 දින වන විටත් පියවා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොවූ මාස 6 ඉක්මවූ රු.1,692,901 ක් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) චක්‍රලේඛ

2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගනක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වෙනම ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.10,418,071 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.29,377,302 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව නිසි මූල්‍ය පාලනයක් පවත්වා ගත යුතු වුවද, ඊට අනුගත නොවී කටයුතු කිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අංක 2757387 දරන ජංගම ගිණුමේ රු.4,775,585 ක අයිරාවක් පැවති අතර ඒ සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.21,655 ක අයිරා පොලියක් ගෙවා තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 හිඟ ආදායම්

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අය කර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.15,435,899 ක් වූ හිඟ ආදායම් අයකර ගෙන නොතිබුණි.

### 2.3.2 වරිපනම් බදු

(අ) 2014 වර්ෂය සහ ඊට පෙර සිට පැවත එන හිඟ වරිපනම් බදු ශේෂය රු.12,733,368 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම හිඟයෙන් රු.9,224,376 ක් අය විය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු ලෙස රු.8,147,937 ක් බිල් කර තිබූ අතර එයින් රු.2,561,586 ක් වර්ෂය අවසාන වන විට අය විය යුතුව තිබුණි.

### 2.3.3 කඩකුලී

2014 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ශේෂය රු.1,829,330 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,283,505 ක් අය විය යුතුව තිබුණි.

### 2.3.4 කර්මාන්ත බදු

2014 වර්ෂයේ සිට පැවත එන හිඟ හිටි කර්මාන්ත බදු ශේෂය වූ රු.14,999 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත්, අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 61,448,668 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 25,297,329 |
| මුද්දර ගාස්තු | 36,151,339 |

2.3.6 **ඉඩම් විකිණීම මත බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට එකක ආදායමක් සභාව විසින් ලබා ගත යුතුය. සභාවේ ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට එකක මුදල වශයෙන් රු.212,980 ක්, ඉඩම් විකිණීම් 64 කින් 2015 වර්ෂයේදී ලබා ගෙන තිබූ අතර දල ඇස්තමේන්තුව හා වෙළඳපොල විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 **ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු**

බේරුවල ප්‍රාදේශිය සභාවේ 2014 නොවැම්බර් 14 දිනැති අංක 1889 දරන 2015 වර්ෂයට අදාලව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගැසට් නිවේදනයට අනුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම හා ප්‍රදර්ශණය කිරීම වෙනුවෙන් උපලේඛණයේ දක්වා ඇති පරිදි ගාස්තු අය කළ යුතු වුවත් 2015 ඔක්තෝබර් 06 දින කරන ලද විගණන නියැදි භෞතික පරීක්ෂාවට අනුව ගාස්තු අය කළ යුතු ප්‍රචාරක දැන්වීම්/ නාම පුවරු 37 ක් සඳහා අදාල ගාස්තු අයකිරීමට සභාව කටයුතු නොකිරීම නිසා සභාවට නොලැබී ගිය ආදායම රු.117,775 ක් බව නිරික්ෂණය විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලවල පොත් බැහැර දෙන අංශයෙන් සාමාජිකයින් විසින් ලබාගෙන ආපසු භාර නොදුන් පොත් 426 ක වටිනාකම රු.57,189 ක් වූ අතර සභාව විසින් එම පොත් ආපසු ලබාගැනීමට හෝ ඒවායේ වටිනාකම අයකරගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) අළුත්ගම සහ පයාගල පුස්තකාලවල පිළිවෙලින් පොත් 1357 ක් සහ පොත් 109 ක වටිනාකම රු.40,045 ක් සහ රු.15,120 ක් වශයෙන් එකතුව රු.55,165 ක් වටිනාකම ඇති පොත් අස්ථානගත වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සභාව ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේදී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් සභාවට ලැබී තිබූ Belvan (බෙල්වාන්) වර්ගයේ ට්‍රැක්ටරය ලියාපදිංචි කිරීමකින් තොරව භාවිතා කරමින් පැවතුණි.

3.2 **නිශ්ක්‍රිය වත්කම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයේදී මිලදී ගත් රු.1,999,850 ක් වටිනා තාර උණු කිරීමේ යන්ත්‍රය මිලදී ගත් දින සිටම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන අක්‍රියව තිබුණි.

(ආ) සභාව සතු ඩබල් කැබ් රථයක්, අත් ට්‍රැක්ටර්යක්, ත්‍රී රෝද රථයක් හා ජේ.සී.බී.යන්ත්‍රයක් කිසිදු අළුත්වැඩියාවකින් හෝ භාවිතයකින් තොරව පවතින බැව් විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) සභාව සතු කඩකාමර 30 ක් බදුදීමකින් තොරව කිසිදු ආදායම් ඉපයීමක් නොමැතිව වසර 15 ක පමණ සිට නිශ්කාර්යව පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය